# ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ප්‍රවෘත්ති සඟරාව
# லுணுகலை பிரதேச செயலக செய்தி மடல்
# LUNUGALA DIVISIONAL SECRETARIAT NEWS BULLETIN

www.lunugala.ds.gov.lk  divseclunugala@gmail.com  Divisionalsecretariat Lunugala




විද්‍යුත් සඟරාවක් වූ කලී වචනයේ පරිසමාප්ති අර්ථයෙන් තොරතුරු හා නිවේදන විද්‍යුත් මාර්ගයෙන් සන්නිවේදනය වන්නා එකතුවකි. තොරතුරු වලින්, දැනුමෙන් හා දැනුවත්භාවයෙන් පණ පෙවුණු ප්‍රබෝධමත් සමාජයක් අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය හරහා නිර්මාණය කිරිම විද්‍යුත් සඟරාවක් තුලින් ඉටු විය යුතු යුතුකමකි. එම යුතුකම හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට නම් නිර්මාණාත්මක සාමූහික ප්‍රයත්නයක් අත්‍යාවශ්‍ය වනු ඇත. කඩදාසියක් මත මුද්‍රණය වූවත්, විද්‍යුත් මාධ්‍යයෙන් නිර්මාණය වූවත්, කුමන භාෂාවෙන් හෝ කුමන මාධ්‍යයෙන් ජනතාව වෙත ලඟා වූවත් නිතිපතා ඒ තුළින් සිදු විය යුතු වන්නේ මහජනයා වෙත සේවයක් සහ යහපතක් සැලසීම වන්නේය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් යනු බිම් මට්ටමේ සියලුම ප්‍රජාවන් වෙනුවෙන් නිරන්තර සේවාවක් සපයන්නා වුත්, ඉහල මට්ටමේ කාර්යාල දක්වා ඍජු සම්බන්ධීකරණයක් ඇති කළ හැකි සේවා සැලසීමේ ධාරිතාවයක් සහිත ආයතනයක් වනු ඇත. ඉන් ලබා දෙන සේවාවන් සම්බන්ධව ප්‍රජාව බොහෝ විට දැනුවත් වූවත් එම කාර්යාලයක් තුල මහජන සේවය සැලසීම් උදෙසා දෛනිකව ගන්නා වු ප්‍රයත්නයන් එවායේ නිමැයුම් සහ සාර්ථකභාවය පිළිබද සමාජයක් ලෙස දැනුවත් වීම පවතිනුයේ අවම මට්ටමකය.

ඉතා අවම කාර්ය මණ්ඩලයක් සහිතව සීමිත භෞතික සම්පත් ප්‍රමාණයකින් යුක්තව කාර්යක්ෂම හා ඵලදායි මහජන සේවයක් සලසන්නා වු ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් නිර්මාණය කරන්නට යෙදුනා වු මෙම සඟාරව තුලින් ඔවුන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි. දැනුවත්භාවයෙන් පිරිපුන් යහපත් සමාජයක් බිහි කර රටේ අනාගත සුභසිද්ධිය උදෙසා ප්‍රාදේශීය පාලනයේ නියමුවා ලෙසන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්වරයා සහ කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා ගන්නා මෙම සාමූහික ප්‍රයත්නය සාර්ථකත්වයට පත්වේවායි පතමින් මාගේ සුභාසිංශන මෙලෙසින් එක් කරන්නෙමි.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
බදුල්ල



**ප්‍රාදේශිය ලේකම් කාර්යාල ප්‍රාදේශිය පරිපාලන යාන්ත්‍රණයේ හරය ලෙස ක්‍රියා කරයි. ආණ්ඩුවේ බොහෝ කාර්යයන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා ජනතාව අතරට ගෙන යනු ලැබේ. අද පවතින නවීන තාක්ෂණික පහසුකම් උපයෝගි කරගනිමින්**
**ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් සිදුකරන කටයුතු මහජනතාවට සහ පාර්ශවකරුවන්ට හෙළිදරව් කරමින් ඒවා ලේඛනගත කිරීම තුළින් වඩාත් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් මහජනතාවට ලබාදිය හැකි බව මාගේ විශ්වාසයයි.**
**මේ ආකාරයට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විද්‍යුත් පුවත්පත ආරම්භ කිරීම ගැන මා හට ඇත්තේ ඉමහත් සතුටකි. මා හට ප්‍රාදේශිය පරිපාලනය සඳහා නිරන්තරයෙන් මගපෙන්වමින් උපදෙස් ලබාදුන් ඒ වගේම ඊ සඟරාව සඳහා සුභ පැතුම් ඒක් කල දිසාපතිතුමාටත් , සහයෝගය දැක්වු උපදේශන කමිටුව, ප්‍රාදේශිය ලේකම් කර්යාල මාධ්‍ය අංශයට සහ ප්‍රාදේශිය ලේකම් කර්යාලයේ සියලුම නිලධාරින්ට මාගේ අවංක ස්තූතිය පුද කරමි.**

**මෙහෙයවීම - එස්.පුවනේන්ද්‍රන් මහතා**

**ප්‍රාදේශිය ලේකම් ,ලුණුගල**

**උපදේශන කමිටුව -**

- ඩබ්.ඒ.බී.පී.දයානන්ද මිය - සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන ) -
- ඒ.එම්.අයි.ප්‍රියදර්ශනි මිය - පරිපාලන නිලධාරි -
- ආර්.එම්.කීර්තිනන්ද රාජපක්ෂ මහතා - පරිපාලන ග්‍රාම නිලධාරි
- **සකස් කළේ -**
- ඩී.එම්.පී.එම්.එස්.දිසානායක මහතා - කලමනාකරණ සේවා නිලධාරි
- **පරික්ෂා කළේ -**
- ඩබ්.ඒ.බී.පී.දයානන්ද මිය - සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන ) -
- එස්.රාජදුරෙයි මහතා - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි

## නව වසරට සුබ පතා
## පරිත්‍රාණ ධර්ම දේශනාවක්....










**උදාවන 2025 නව වර්ෂයට සුබ පතා 2024.12.30 දින ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලය මගින් සංවිධානය කරන ලද පරිත්‍රාණ ධර්ම දේශනය ලුණුගල ශාසනාරක්ෂක බල මණ්ඩළයේ ගරු ලේඛකාධිකාරි අතිපූජ්‍ය කැන්දවින්නේ ගුණානන්ද හිමියන් ප්‍රමුඛ ගරුතර මහා සංඝ රත්නයේ ප්‍රධානත්වයෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්‍යාල පරිශ්‍රයේ දී පැවැත්විණි . කාර්‍යාලීය නිලධාරීන්, ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව, ප්‍රාදේශීය සභාව ප්‍රමුඛ රාජ්‍ය ආයතන සියල්ල මේ සඳහා දායක විය. කාර්‍යාලීය නිලධාරීන්ට සහ සියලුම සේවාලාභී මහජනතාවට සෙත් පැතීම මෙහි ප්‍රධාන අරමුණ විය.**

# ජනාධිපති අරමුදල

ඔබ සැත්කම / ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසුව මූල්‍යාධාර අයදුම් කර ඇත්නම් ජනාධිපති අරමුදල විසින් ඔබ මූල්‍යාධාර ලබා ගැනීමේ සුදුස්සෙක් ලෙස තෝරා ගනු ලැබුවහොත් ඔබට අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා මුදල් ලබාගත හැකිවේ.

ඔබ සැත්කම /ප්‍රතිකාර කිරීමට පෙර මූල්‍යාධාර අයදුම් කර ඇත්නම් ජනාධිපති අරමුදල විසින් ඔබ මූල්‍යාධාර ලබාදීමට සුදුස්සෙකු ලෙස තෝරා ගනු ලැබුවහොත් සැත්කමට / ප්‍රතිකාරයට නියමිත දිනට පෙර අදාල රෝහල වෙත අනුමත මුදල දක්වමින් වගකීම් ලිපියක් ජනාධිපති අරමුදල විසින් යොමු කරනු ලබයි.

ජනාධිපති අරමුදලට අයදුම් කිරීම සඳහා ,

WWW.PRESIDENTSFUND.GOV.LK වෙබ් අඩවිය මගින් බාගත කිරීමෙන් හෝ QR කේතය මගින් අයදුම්පත් ලබා ගත හැක.

ජනාධිපති අරමුදල සඳහා අයදුම් කළ යුත්තේ,

- සැත්කමට /ප්‍රතිකාරයට දින 30 කට පෙර අයදුම් පත්‍රය භාරදිය හැකිය.
- සැත්කම හෝ ප්‍රතිකාරය සිදු කර රෝහලෙන් බැහැර වී දින 60 ක් ඉක්මවීමට පෙර භාරදිය හැකිය.

ජනාධිපති අරමුදල සඳහා අයදුම් කිරීමේදි අවශ්‍ය ලේඛන,

- රෝගයට අදාළ වෛද්‍ය නිර්දේශයේ මුල්පිටපත
- සැත්කමට / ප්‍රතිකාරයට පෙර අයදුම් පත්‍රය භාර දෙන්නේ නම් ,සැත්කම/ප්‍රතිකාරය සඳහා යන වියදම් ඇස්තමේන්තුවේ මුල් පිටපත
- සැත්කම/ප්‍රතිකාරයට පසු අයදුම් පත්‍රය භාරදෙන්නේ නම්,සැත්කම/ප්‍රතිකාරයට අදාළ ගෙවීම්වල මුල් කුවිතාන්සිපත්
- රෝගියාගේ හා පවුලේ අයලගේ බැංකු ගිණුම් වාර්තා
- රෝගියාගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායාපිටපතක්
- රෝගියාගේ හා පවුලේ සාමාජිකයන්ගේ ආදායම් විස්තර
- දිවුරුම් ප්‍රකාශ
- ණය ලබා ගැනීම,රන් භාණ්ඩ උකස් කිරීම් වේ නම්,තහවුරු කරන ලේඛන පිටපත්
- අවශ්‍ය වෙනත් ලේඛන

මෙ සම්බන්ධව වැඩිදුර විස්තර ලබා ගැනීම සඳහා

- ඔබ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි මගින්
- ඔබ පදිංචි ප්‍රදේශයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින්
- ජනාධිපති අරමුදල ඇමතීමෙන් දු.ක. 0112354354

WWW.PRESIDENTSFUND.GOV.LK

“අපි සැමවිටම අවංකව හා සත්‍යවාදීව කටයුතු කර ප්‍රතිලාභ අවැසිනම් පමණක් ලබා ගනිමින් අනාගතයේ රෝගිවන පුද්ගලයෙක්ගේ,අපේ ඥාතියෙකුගේ ජීවිතය සුරැකීමට දායක වෙමු

ජනාධිපති අරමුදල
ஜனாதிபதி நிதியம்
President's Fund

**ජනාධිපති අරමුදල ඔබේ ගමට**

ජනාධිපති අරමුදල මඟින් ලබාදෙන වෛද්‍යාධාර අයදුම්පත් භාරදීම සඳහා දැන් ඔබ කොළඹට පැමිණීම අවශ්‍ය වන්නේ නැහැ.

දැන් ඔබට ඔබ පදිංචි ප්‍රදේශය අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් වෛද්‍යාධාර අයදුම්පත භාරදීමට හැකියි.

**ජනාධිපති අරමුදලෙන් මූල්‍යාධාර ලබාගත හැකි සැත්කම් / ප්‍රතිකාර සහ මූල්‍යාධාර ප්‍රමාණ**

| හෘදවත් සැත්කම් | | |
|---|---|---|
| බයිපාස් සැත්කම් (CABG) | - | රු. 250,000.00ක උපරිමයක් දක්වා |
| ස්ටෙන්ට් සැත්කම් (PCTA) | - | රු. 300,000.00ක උපරිමයක් දක්වා |
| ඉහත සැත්කම් ද ඇතුළුව හෘදය ආශ්‍රිත සැත්කම් 37ක් සඳහා | | |
| වකුගඩු ආශ්‍රිත ප්‍රතිකාර / සැත්කම් | | |
| වකුගඩු බද්ධ කිරීම | - | රු. 500,000.00ක උපරිමයක් දක්වා |
| රුධිර කාන්දුකරණය | - | රු. 500,000.00ක උපරිමයක් දක්වා |
| පිළිකා ප්‍රතිකාර | | |
| පිළිකා ප්‍රතිකාර සඳහා උපරිමය රු. 500,000.00 දක්වා | | |
| මොළය ආශ්‍රිත සැත්කම් | | |
| Brain Tumor | - | වියදමෙන් 1/3ක් හෝ රු. 600,000.00 උපරිමය දක්වා |
| ඉහත සැත්කම් ද ඇතුළුව තවත් සැත්කම් 08ක් සඳහා | | |
| විකලාංග රෝපණය (Orthopaedic Implant) | | |
| උකුල් ඇට බද්ධය (Hip) | - | රු. 300,000.00 උපරිමයක් දක්වා |
| දණහිස් බද්ධය (Knee) | - | රු. 300,000.00 උපරිමයක් දක්වා |
| උරහිස් බද්ධය (Shoulders) | - | රු. 300,000.00 උපරිමයක් දක්වා |
| සුෂුම්නාව ආශ්‍රිත සැත්කම් | - | රු. 300,000.00 උපරිමයක් දක්වා |
| ඇට මිදුළු බද්ධ කිරීම | | |
| ඇට මිදුළු බද්ධ කිරීම | - | රු. 600,000.00 දක්වා |
| ප්‍රාථමික සෛල බද්ධ කිරීම | - | රු. 600,000.00 දක්වා |
| අක්මාව ආශ්‍රිත සැත්කම් / ප්‍රතිකාර | | |
| අක්මා බද්ධ කිරීම | - | රු. 600,000.00 |
| සැත්කමට පෙර/පසු ප්‍රතිකාර හා ඖෂධ සඳහා | - | රු. 300,000.00 |
| දරුවන් සඳහා අක්මා බද්ධ කිරීම | | |
| වයස අවුරුදු 16ට අඩු දරුවන්ගේ රාගම රෝහලේ සිදු කරනු ලබන අක්මා බද්ධ කිරීම් සඳහා | - | රු. 1,000,000.00 |
| කර්ණ ශංඛ බද්ධය | - | රු. 600,000.00 |
| ශ්‍රවණ උපකරණ | - | වියදම රු. 400,000.00ට අඩු නම් එයින් අඩක් හෝ උපරිමය රු. 300,000.00 දක්වා |
| ශ්‍රවණ උපකරණ | - | රු. 100,000.00 |

## 77 වැනි නිදහස් දින සැමරුම







ජාතික නිදහස් දිනයට සමගාමීව ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී හා ස්වින්ටන් දෙමළ විද්‍යාලයේදී ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් පැවැත්විණි.
ප්‍රථමයෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී ප්‍රාදේශීය ලේකම්තුමා විසින් ජාතික කොඩිය එසවීමෙන් අනතුරුව ජාතික ගීය වාදනය කර පරිපාලන ග්‍රාම නිලධාරි තුමා විසින් ජාතික දිනය පිළිබඳව කෙටි දේශනයක් පැවැත් වූ අතර ප්‍රාදේශීය ලේකම්තුමා අදහස් දැක්වීමෙන් අනතුරුව කාර්යාල පරිශ්‍රයේදී ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.

මින් අනතුරුව පරිසර නිලධාරිනියගේ සංවිධානයෙන් ස්වින්ටන් දෙමළ විදුහලේදී ජාතික නිදහස් දිනයට සමගාමීව ප්‍රාදේශීය ලේකම් තුමාගේ හා පස්සර කලාප අධ්‍යක්ෂතුමියගේ ප්‍රධානත්වයෙන් වැඩසටහනක් පැවැත්වූ අතර එහිදී රුක් රෝපණ වැඩසටහනක් හා ප්‍රාදේශීය ලේකම් තුමා විසින් පාසල් ළමුන් සඳහා දේශනයක් පැවැත් වූ අතර, සහභාගී වී සිටි අනෙකුත් ආරාධිත අමුත්තන් විසින් ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කරන ලදී. මෙයට අමතරව පාසල් සිසු සිසුවියන්ගේ කුසලතා එළිදැක්වීමක්ද සිදු විය.

## හෙළයට ජීවගුණය කැඳ වූ ජනකෙළි







ජනකෙළි වල සමාජීය මෙහෙවර හා වැදගත්කම පිළිබඳව පාසල් දරු දැරියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංස්කෘතික නිලධාරි දිලංගනි ලක්මාලි මහත්මියගේ මෙහෙයවීමෙන් කොට්ටල්බැද්ද ප්‍රාථමික විද්‍යාලයේ දි පැවැත්වූ අතර ඒ සඳහා දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරි චන්දික රත්නායක මහතා විසින් සම්පත්දායකත්වය ලබාදෙන ලදි.

## මතක සුවඳ ....

'මතක සුවඳ ' රසවින්දනාත්මක වැඩසටහනක් සංස්කෘතික නිලධාරි දිලංගනි ලක්මාලි මහත්මියගේ මෙහෙයවීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩිහිටි සමිති සාමාජිකයන් සඳහා පැවත්වන ලද අතර ඒ සඳහා බදුල්ල දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරි චන්දික රත්නායක මහතා ඇතුළු බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංස්කෘතික නිලධාරින් සම්පත් දායකත්වය ලබාදෙන ලදි.

මෙම අවස්ථාවට ලුණුගල ප්‍රාදේශීය ලේකම්තුමා සහ සැලසුම් අධ්‍යක්ෂතුමියද සහභාගි විය.



# සෙනෙහසේ නවාතැන








ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක " සෙනෙහසේ නවාතැන " ව්‍යාපෘතිය මඟින් ලබාදෙන රුපියල් 5,00000.00 මූල්‍ය ප්‍රතිපාදන මත ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූරියගොඩ ග්‍රාම නිලධාරී වසමේ පාස්රෝස් කොටස පදිංචි එම්.කලෙයිනාදන් මහතාගේ නිවස ප්‍රතිසංස්කරණය කර 2025.01.01 දින ප්‍රාදේශීය ලේකම් එස්.පුවනේන්ද්‍රන් මහතාගේ අතින් භාරදෙන ලදි.

## ගර්භණී මව්වරුන් සඳහා උපදේශන වැඩසටහනක්...



ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පදිංචි ගර්භනී මව්වරුන් 32 ක් සඳහා උපදේශන වැඩසටහනක් ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ උපදේශන නිලධාරි විසින් ජනවාරි 15 දින ප්‍රාදේශීය ලේකම් කායීාලයේදී පවත්වන ලදි.

## විදේශගත ශ්‍රමික පවුල් දැනුවත් කිරීම...



විදේශගත ශ්‍රමික පවුල් 32 ක සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් විදේශ රැකියා නිලධාරි විසින් හොප්ටන් ප්‍රජා ශක්ති ශාලාවේදි පවත්වන ලදි.

# ආපදා අවදානම අවම කිරීමේ පෙර සූදානම







2025 වර්ෂයේ ලුණුගල කොට්ඨාසයේ ආපදා අවදානම අවම කිරීම සහ පෙර සූදානම් වැඩසටහන් හා අදාළව ක්‍රියාත්මක වන පුහුණු වැඩසටහන් මාලාවේ පළමු වැඩසටහන වන ප්‍රථමාධාර සම්බන්ධයෙන් එක්දින පුහුණු වැඩසටහනක් 2025.03.03 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වුණි.

මේ සඳහා වර්ල්ඩ් විශන් ආයතනය හා ලංකා රතුකුරුස සංවිධානය අනුග්‍රහය දක්වන ලදි.

## මතින් තොර රටක් උදෙසා





ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පාසල් ළමුන් මත්ද්‍රව්‍ය උවදුරෙන් ගලවා ගැනීම උදෙසා හා කාන්තා දිනයට සමගාමීව පවුල් තුළ සතුට අභිමි කිරීම හා ඒ හේතුවෙන් කාන්තාවන්ට සිදුවන හිංසනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සංවර්ධන නිලධාරිනියගේ සම්පත් දායකත්වයෙන් මිල්ලබැද්ද විද්‍යාලයේ දි හා හොප්ටන් වසම තුළදි පැවැත්විණි.

## පාසල් දරුවන්ට පොත් කට්ටල ලබාදීම.





ප්‍රාදේශීය ලේකම් තුමාගේ ඉල්ලීම පරිදි වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය විසින් ලුණුගල නගර වසමේ පදිංචි දරුවන් සඳහා පොත් කට්ටල ලබා දීමේ වැඩසටහනක් ජනවාරි 29 වන දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙදි පැවැති අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් තුමා,ග්‍රාමීය කමිටු නිලධාරින් ,ළමාහිමි කම් නිලධාරි, වර්ල්ඩ් විෂන් ආයතනයේ නිලධාරින් සහභාගි විය .

## පෙර පාසල් දරුවන් උදෙසා



පෙර පාසල් දරුවන්ගේ පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීම උදෙසා පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම යටතේ සුමුදුගම පෙර පාසල තුළ පෝෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මුල් ළමාවිය සංවර්ධන නිලධාරිනිය විසින් සිදු කරන ලදි.

## විදේශගත පවුල් සඳහා.....



වැඩසටහන සඳහා විද්‍යාලයේ විදුහල්පතිතුමා සහ වැවිලි ප්‍රජා සංවර්ධන නිලධාරී නොමද සහයක් ලබා දුන් අතර මඩොල්සිම පොලිස් ස්ථානයේ නිලධාරින්ද මෙම අවස්ථාවට සම්බන්ධ විය.

විදේශගත මව්වරුන්ගේ දරුවන් රැකබලා ගනු ලබන භාරකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් බ/ බටවත්ත විද්‍යාලයේදී පැවැත්වූ අතර බදුල්ල කොට්ඨාස භාර ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති විසින් මෙම දරුවන් සුරක්ෂිතව රැකබලාගැනීමේ කාර්ය භාරය පිළිබඳව දැනුවත් කළ අතර විදේශ කටයුතු ප්‍රවර්ධන නිලධාරී විසින් විදේශගත මව්වරුන්ගේ දරුවන් සම්බන්ධයෙන් භාරකරුවන් සතු වගකීම පිළිබඳවද දැනුවත් කරන ලදී. .

## ළමා කමිටු .......



ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශිය මෙහෙයුම් කමිටු රැස්වීම හා මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම 2025.03.24 වන දින කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දි පැවැත්වූ අතර මෙහිදි කොට්ඨාසයේ දරුවන් සම්බන්ධ විවිධ ගැටළු සාකච්ඡා කිරීම සියලුම ළමා කමිටු නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර මෙය පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා අන්තරායක ඖෂධ ජාතික මණ්ඩලයේ ප්‍රතිපාදන මත සිදු කරන ලදි.





ළමා ආරක්ෂාව හා අනාගත ඉලක්ක ජය ගැනීමට අදාළව අලකොළගල ප්‍රාදේශිය ළමා කමිටුව එක්ව සංවිධානය කරන ලද දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.03.06 දින බ/ තිරුමගල් විද්‍යාලයේ දි පැවති අතර මෙම වැඩසටහන සඳහා වර්ල්ඩ් විෂන් ආයතනය විසින් මූල්‍යමය දායකත්වයෙන් සපයන ලදි.

## අස්වැසුම සමීක්ෂණය..









ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කොහොනාවල වසමේ අස්වැසුම සමීක්ෂණ රාජකාරි කටයුතු සඳහා ප්‍රාදේශිය ලේකම් තුමා ඇතුළු ග්‍රාමීය කමිටු නිරධාරින් විසින් 2025.03.05 වන දින සහභාගි වන ලදි.

## පොදු කොට්ඨාසය...

ලුණුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පොදු කොට්ඨාස දින රැස්වීම ප්‍රාදේශිය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2025.03.26 වන දින පවත්වන ලදි.






## තැනුමට තිරසර හෙටක් – සවිමත් ඇය වේ මහක්






ජාත්‍යන්තර  කාන්තා දිනයට සමගාමීව‘ තැනුමට තිරසර හෙටක් – සවිමත් ඇය වේ මහක්’යන කාන්තා දින තේමාව මුල් කර ගනිමින් වනිතා සංවර්ධන නිලධාරිනියගේ ප්‍රධානත්වයෙන්හා උපදේශන නිලධාරියගේ සම්පත් දායකත්වයෙන්  කාන්තා දින වැඩසටහන් මාලාවක් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය  පුරා පැවැත්විණි.

## යහපත් දරුවෙක් උදෙසා...




යහපත් දරුවන් සමාජ ගත කිරිම උදෙසා බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරිනියගේ ප්‍රධානත්වයෙන් මඩොල්සිම ශ්‍රී උපනන්ද දහම් පාසලේ මා පිය වන්දනා වැඩසටහනක් පැවැත්විණි.

## දහම් දරුවන්ගේ දක්ෂතා ඇගයීමක්...

බෝසත් දරුවන් සමාජ ගත කිරීම දහම් පාසල් අධ්‍යාපනයේ මූලික අරමුණ වේ. දරුවන්ගේ විවිධ දක්ෂතා ඇගයීමක් දහම් පාසල් පැමිණීම,මල්  ඍගෙන ඒම ආදි යහපත් පුරුදු ඇති කිරීම සදහාත් ශ්‍රී සාරානන්ද දහම් පාසල මගින් පෙබරවාරි 16 දින දහම් පාසල් ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රධානොත්සවයක් පැවැත්විණි. බුදු දහමේ එන දහම් කරුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට ගන්නා වූ වැයමට බෙහෙවින් තුති පුදමු.



# පරිසර හා ඉඩම්

## උඩකිරුව වැසි වනාන්තරය සංරක්ෂණය








ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය හා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සිදුකරන උඩකිරුව වැසි වනාන්තරය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියට අදාළව දඹකොටේ රක්ෂිතයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් පැළ 1000+ කට වැඩි සංඛ්‍යාවක් සිටුවීමේ වැඩසටහනක් ජනවාරි මාසයේ දී සාර්ථකව සිදු කරන ලදි.

## කසළ ප්‍රතිචක්‍රියකරණය



කසළ ප්‍රතිචක්‍රියකරණය කිරීමේ වැඩසටහනට අදාළව පරිසර සංවර්ධන නිලධාරිනියගේ මගපෙන්වීම යටතේ බ/ ජනතාපුර විද්‍යාලයේදී, පරිසර නියමු කණ්ඩායම් භාර ගුරුතුමියගේ සහයෝගය මත පරිසර නියමු ශිෂ්‍ය ශිෂ්‍යාවන් රැස්කළ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමුකරන ලද අතර මෙහිදි පාසලට රු. 18 555.00 මුදලක් හිමි වූ අතර එම මුදල් සිසුන්ගේ ඉතුරුම් ගිණුම් වලට බැර කරන ලදී.



# පරිසර හා ඉඩම්

## රුක් රෝපණ වැඩසටහනක්...





ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බ/ ජයබිම විද්‍යාලයේදී ක්‍රියාත්මක කළ පළතුරු පැළ රෝපණය කිරීමේ වැඩසටහන හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පරිසර සංවර්ධන නිලධාරිනියගේ සංවිධානයෙන් ප්‍රාදේශිය ලේකම් තුමා,විදුහල්පති තුමා ඇතුළු නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පෙබරවාරි 05 වන දින පැවැත් වූ අතර එහිදි ප්‍රාදේශීය ලේකම් තුමා විසින් පරිසරයට ආදරය කරන දරුවකු බිහිකර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධාරණය කරන ලදී.

## CLEAN SRI LANKA









Clean Sri Lanka වැඩසටහනේ ජල උල්පත් සංරක්ෂණය සඳහා වන පළමු අදියර ලෙස හා මාර්තු 22 දිනට යෙදෙන ලෝක ජල දිනය නිමිත්තෙන් පීස්සගම වසමේ මඩමේ අරාව ජල උල්පත පිරිසිදු කිරීම හා උල්පත අවට පැළ රෝපණ වැඩසටහන පරිසර නිලධාරි හා වසම්භාර ග්‍රාම නිලධාරි,ආර්ථික සංවර්ධන නිලධාරි දෙපළගේ සංවිධානයෙන්, ප්‍රාදේශීය ලේකම් තුමා ඇතුළු නිලධාරීන්ගේ සහභගිත්වයෙන්, ප්‍රජා ජල සමිතියේ ජල පාරිභෝගිකයන්ගේ ශ්‍රම දායකත්වයෙන් මාර්තු 22 වන දින සිදු කෙරිණි.

# ඒකාබද්ධ ප්‍රවේශය තුළින් සංරක්ෂණය කිරීමට යෝජිත කොකෝවත්ත ජල පෝෂිත ප්‍රදේශය

ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර බෑවුමේ පිහිටි පල්ලෙකිරුව හා වේරගොඩ යන ග්‍රාම නිලධාරී වසම් වලට අයත් භූමිභාගය පාරිසරික වශයෙන් ඉතාමත් වැදගත් කලාපයක් ලෙස හඳුනාගෙන තිබේ.

උඩකිරුව වනාන්තර ප්‍රදේශයෙන් ආරම්භ වන කිරි ඔය පල්ලෙකිරුව, වේරගොඩ හා පීස්ස යන වසම් මායිම් ඔස්සෙ ගමන් කර කුඹුක්කන් ඔය හා එක්වනු ලැබේ.

මෙහිදී පල්ලෙකිරුව හා වේරගොඩ වසම් වලට අයත් මෙම කොකෝවත්ත ඉඩමේ වන වැස්ම තුළින් ආවරණය වන කඳුරු බොහෝමයක් කිරි ඔය පෝෂණය කිරීමට දායකත්වය ලබා දේ.

පරිසර පද්ධතියේ පවතින සංවේදී තත්ත්වයන් අනුව ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලෙකිරුව හා වේරගොඩ වසම් දෙකට අයත් කොකෝවත්ත ඉඩම සුවිශේෂී පරිසර ද්ධතියක් ලෙස වෙන්කර තැබීම සඳහා දිස්ත්‍රික් පරිසර හා වන ආරක්ෂක කමිටුවේ දී ගන්නා ලද තීරණයකට අනුව මෙම කාර්යයේදී සෘජුවම සම්බන්ධවන වන ආයතන ලෙස පහත සඳහන් ආයතන වල සහභාගිත්වයෙන් ක්ෂේත්‍රයේ දී තොරතුරු රැස් කිරීම සිදුකරන ලදී.

01. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල

02. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ලුණුගල

03. ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය - බදුල්ල


04. ඉඩම් ප්‍රතිසංස්කරණය කොමිෂන් සභාව

05. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

06. මධ්‍යම පරිසර අධිකාරිය

උක්ත ආයතන වල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් හෙක්ටයාර් 365 ක පමණ භූමි භාගයක ඇවිද යමින් විවිධ තොරතුරු, නිර්දේශ ලබා ගනිමින් GIS තාක්ෂණය භාවිතවයන් සිතියම් සකස් කර එම දත්ත මත පදනම්ව වාර්තාව සකස් කිරීම සිදුකරන ලදී.
එම වාර්තා මත දිස්ත්‍රික් පරිසර හා වන ආරක්ෂණ කමිටුවේදී කොකෝවත්ත ඉඩම් කොටසේ මැනුම් කටයුතු සිදු කිරීමට යෝග්‍ය බවට තීරණය කෙරිණි.එහිදී වගා කළ ඉඩම් හැර අනෙකුත් සියලුම බිම් කොටස් 2025.03.17 දින සිට 2025.03.26 දින දක්වා රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැනුම් කටයුත් සිදු කරන ලදී.

මෙම සංවේදි පරිසර පද්ධතිය රක්ෂිතයක් ලෙස ගැසට් කර ගැනීම සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් තුමා ඇතුළු, පරිපාලන ග්‍රාම නිලධාරි,ඉඩම් පරිහරණ නිලධාරි, ජනපද නිලධාරි, පරිසර නිලධාරී හා වසම් භාර ග්‍රාම නිලධාරීන් හා සංවර්ධන නිලධාරි ඇතුළුව වසමේ ප්‍රජාවගේ සහයෝගයද සහිතව සාර්ථකව සිදු කරන ලදි.










## සමෘද්ධි

### සමෘද්ධි ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන








සමෘද්ධි ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන 2025-2027 ට අදාළව ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.01.10 දින ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ .ලුණුගල ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනට සම්පත්දායකත්වය සපයන ලද්දේ සහකාර සමෘද්ධි අධ්‍යක්ෂ ඩී.එස් රත්නායක සහ හපුතලේ සමෘද්ධි කළමණාකාර ආරියසේන යන නිලධාරී මහත්වරුන් විසින්ය.

### හිසට සෙවණක්





2024 සමෘද්ධි විශේෂ වැඩසටහන යටතේ  මිල්ලබැද්ද,ජනතාපුර උතුර,අරවාකුඹුර වසම් වල ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති විවෘත කිරීම ප්‍රාදේශිය ලේකම්තුමා,සමෘද්ධි අධ්‍යක්ෂතුමාගේ  ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

## සමෘද්ධි

### ප්‍රජාව දැනුවත් කිරීම





අරවාකුඹුර වසමේ අක්ෂි සායනය, පාසල් නොයන ළමුන් පාසල්ගත කිරීම හා අනාරක්ෂිත ස්ථානවල ළමුන් ගැවසීම ආදිය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම වසමේ ග්‍රාමීය කමිටු නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

### ඩෙංගු මාරයා පරදවමු





ඩෙංගු මර්දන වැඩසටහනට සමගාමීව සමෘද්ධි සංවර්ධන නිලධාරියගේ ප්‍රධානත්වයෙන් සහ සමෘද්ධි ප්‍රතිලාභින්ගේ සහභාගිත්වයෙන් අලකොළගල වසමේ ශ්‍රමදාන කටයුත්තක් පෙබරවාරි 18 වන දින පැවැත්විණි.

### ළමා සමාජයේ වැඩක්...

සමෘද්ධි සංවර්ධන නිලධාරියගේ මගපෙන්වීම යටතේ රන්තරු ළමා සමාජය මඟින් පැවැත්වූ විවාද තරගයක් හා නිදහස් දිනයට සමගාමීව බෝධි පූජාමය ආගමික වැඩසටහනක් අලකොළගල වසම තුළ දී පැවැත්විණි.





# ව්‍යවසායකයින්ට අත්වැලක් - ආර්ථිකයට ශක්තියක්













ඌව පළාත් සභා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ක්‍රමසම්පාදන කාර්යාලය මඟින් ව්‍යවසායකයින් ගොඩනැංවීම උදෙසා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ සිදුකරනු ලබන ව්‍යවසායකත්ව සංවර්ධන ණය වැඩසටහන සඳහා ආණ්ඩුකාරවර කාර්යාලය මඟින් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යවසායකයින් වෙත නිකුත්කර තිබූ ණය අයදුම්පත් සඳහා මූලික සුදුසුකම් පරික්ෂා කිරීමක් මිල්ලබැද්ද,මඩුවත්ත, හොප්ටන්,යපම්ම,උඩ පංගුව යන ග්‍රාම නිලධාරි වසම් තුළ (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ක්‍රමසම්පාදන කාර්යාලයේ සංවර්ධන නිලධාරි ) නලීන ක්‍රිෂාන්ත මහතා විසින් පසුගියදා සිදු කරන ලදි.

මෙහිදී කිරිගව පාලනය,කුකුල් පාලනය,ඇගළුම් කර්මාන්තය,කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන,මිරිදිය මත්ස්‍ය වගාව සහ බේකරි කර්මාන්තය යන ක්ෂේත්‍රයන් යටතේ ව්‍යවසායකයින් සිටින බවට නිරීක්ෂණය විය.

මෙහිදී තෝරාගනු ලැබූ ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු ක්‍රමසම්පාදන කාර්යාලය වෙත යොමු කිරීමෙන් අනතුරුව ඌව පළාත් සභාවේ නිලධාරි මහත්ම මහත්මීන් පිරිසක් 2025.03.11 වන දින මෙම තෝරාගත් ව්‍යවසායකයින්ගේ ක්ෂේත්‍ර පරික්ෂාවන් සඳහා සහභාගි වූ අතර මොවුන් වෙත මූලික කොන්දේසි සපුරාලන ව්‍යවසායකයින් වෙත ඉදිරියේදී ණය මුදල් ලබාදීමට නියමිත අතර මෙහිදී කොට්ඨාසයේ ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැගීම අරමුණයි.

## සබන් නිෂ්පාදන පුහුණුව







ගල්වෙලගම හා උඩපංගුව වසම්භාර සංවර්ධන නිලධාරින් විසින් සංවිධානය කරන ලද ව්‍යවසායකයින් ගොඩනැගීම උදෙසා පැවැත්වූ සබන් නිශ්පාදන පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ව්‍යවසාය සංවර්ධන නිලධාරී සහ විද්‍යාා නිලධාරී විසින් සපයන ලදි.


## වෘත්තීය පුහුණුව පිළිබඳව දැනුවත් කිරීම...

පාසල් දරුවන් හා පාසල් හැරගිය පුද්ගලයින් වෘත්තිය පුහුණුව සඳහා යොමු කිරීමේ අපේක්ෂාවෙන් නිපුණතා සංවර්ධන නිලධාරි විසින් දැනුවත් කිරීමේ වැඩසටහනක් බ/කලයිමහල් විද්‍යාලයේදි හා අඩාවත්ත ප්‍රජා ශක්ති ආයතනයේදි පැවැත්විණි.





# 49 වැනි ජාතික මහ ක්‍රීඩා උළෙල














49 වන ජාතික මහ ක්‍රීඩා උළෙලට සමගාමීව පවත්වනු ලබන අන්තර් ක්‍රීඩා සමාජ තරගාවලියේ කණ්ඩායම් තරග මාර්තු මස 01 දින සිට 23 වන දින දක්වා පැවති අතර එහි සමාප්ත සමාචාරය සහ මලල ක්‍රීඩා උළෙල 2025.04.06 වන දින ලුණුගල සුමුදු ක්‍රීඩාංගණයේ දි පැවැත්වීමට නියමිතය.

# අපෙන් ගමට....













පීස්සගම ග්‍රාමිය කමිටු රැස්විම පීස්ස විහාරස්ථානයේදි පැවැත්වු අතර එහිදි පැන නැගුණු පාසල් නොයන දරුවන් පාසල් ගත කිරීම,පීස්ස මහා ඇල ගැටලුව,රක්ෂිත ගැටලු,මාර්ග ගැටලු හා සංවර්ධනය කිරිමට යෝජිත නිවාස පරික්ෂා කිරීමට ග්‍රාමීය කමිටු නිලධාරින් විසින් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කරන ලදී.

යපම්ම වසමේ සංවර්ධන නිලධාරිනියගේ මූලිකත්වයෙන් යපම්ම ළමා සමාජ දරුවන් සමග නිදහස් දිනයට සමගාමීව නිදහස් දින වැඩසටහනක් පැවැත්වීණි.







ජනතාපුර මධ්‍යම වසමේ පවත්වන ලද ග්‍රාමීය කමිටුව හා ළමා කමිටුව ළමාහිමිකම් නිලධාරි හා ග්‍රාමීය කමිටු නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් මාර්තු 18 වන දින පැවැත්විය.

ගල්වෙලගම සංවර්ධන නිලධාරිනියගේ මූලිකත්වයෙන් හා ප්‍රදේශවාසින්ගේ සහභාගිත්වයෙන් ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්විණි.









# ග්‍රාම නිලධාරින්



නම - ටී.ඒ.එස්.දමයන්ති මිය

වසම - රේන්දපොල

දු.ක - 0704587891



නම - ආර්.එම්.ජී.අයි.රත්නායක මයාමහතා

වසම - පීස්සගම

දු.ක - 0712077692



නම - ආර්.ඒ.ඩී.නිල්මිණී මිය

වසම - උඩපංගුව

දු.ක - 0718373898



නම - ජී.එස්.එස්.වනසිංහ මයා

වසම - මහදෙව්ව ,බටවත්ත (වැ.බ)

දු.ක - 0772976087



නම - කේ.ජී.වික්ටෝරියා මිය

වසම - අත්තනගොල්ල

දු.ක - 0754837138



නම - ආර්.එල්.ප්‍රියන්ති මිය

වසම - මිල්ලබැද්ද

දු.ක - 0712271270



නම - ආර්.එම්.ඩී.නිශාන්ත මයා

වසම - ගල්වෙලගම, ලුණුගල නගරය(වැ.බ)

දු.ක - 0714223182



නම - එම්.එම්.එම්.චන්දිමා මිය

වසම - යපම්ම

දු.ක - 0771692499



නම - ඩබ්.එම්.ආර්.එන්.කරුණාරත්න මයා

වසම - උඩකිරුව

දු.ක - 0712330285



නම - වී.ශෂිදරන් මයා

වසම - මඩොල්සිම

දු.ක - 0719105968



නම - ආර්.එම්.ඩී.එස්.බී.රත්නායක මයා

වසම - අලකොළගල

දු.ක - 0715709220



නම - ජී.ඩබ්.සී.ප්‍රියංගිකා මිය

වසම - සූරියගොඩ

දු.ක - 0711294088



නම - අරුසෙල්වි මිය

වසම - ගල්උල්ල

දු.ක - 0763511654

## ග්‍රාම නිලධාරීන්



නම - එච්.එම්.ආර්.තරංගා මිය

වසම - සුමුදුගම

දු.ක - 0718791001



නම - කේ.උමේෂ්කුමාර් මයා

වසම - අරවාකුඹුර

දු.ක - 0755512414



නම - ඒ.එච්.අයි.ධර්මසිරි මිය

වසම - හොප්ටන්

දු.ක - 0716550666



නම - ඒ.එම්.එස්.ප්‍රමෝද්‍යා මෙය

වසම - පල්ලෙකිරුව

දු.ක - 0702996449



නම - එස්.එච්.එල්.ඩී.ආර්.කුමාරි මිය

වසම - වැවබැද්ද

දු.ක - 0702886116



නම - එම්.එස්.එෆ්.ෆස්නා මිය

වසම - මඩුවත්ත

දු.ක - 0702546224



නම - ඒ.එම්.එස්.ජයවර්ධන මයා

වසම - ජනතාපුර දකුණ ,වේරගොඩ (වැ.බ)

දු.ක - 0771976798



නම - ආර්.ඒ.ඩී.ඩී.මධුවන්ති මිය

වසම - කොට්ටල්බැද්ද

දු.ක - 0717172405



නම - ටී.විදුරුෂා මෙය

වසම - ජනතාපුර උතුර

දු.ක - 0768075212



නම - ඩී.එම්.එස්.නියෝමි මිය

වසම - ජනතාපුර මධ්‍යම

දු. ක - 0763182911



නම - එස්.කිරුපාලන් මයා

වසම - මැටිගහතැන්න

දු.ක - 0 767055092



නම - එච්.ටී.ඩී.ඩී.එච්.මනිෂ්ක මයා

වසම - ඇකිරිය

දු.ක - 0772653029

## ආර්ථික සංවර්ධන නිලධාරීන්



නම - ඒ.එම්.ඒ.ප්‍රියන්ත
වසම - පල්ලෙකිරුව
දු.ක - 0769450100



නම - ආර්.එම්.ඩී.මධුවන්ති
වසම - රේන්දපොළ
දු.ක - 0719298081



නම - එච්.ඒ.අයි.සුබාසිලි
වසම - උඩපංගුව
දු.ක - 0715809790



නම - එන්.කේ.සී.සුමනලතා
වසම - ජනතාපුර උතුර
දු.ක - 0717298818



නම - කේ.පී.එස්.චතුරංගනි
වසම - මිල්ලබැද්ද
දු.ක - 0774672758



නම - එස්.එච්.ඒ.පී.ගුණවර්ධන
වසම - මඩොල්සිම
දු.ක - 0712922156



නම - කේ.සිවයෝගේන්ද්‍රන්
වසම - හොප්ටන්
දු.ක - 0716899749



නම - කේ.එම්.එන්.ප්‍රියදර්ශනි
වසම - සූරියගොඩ
දු.ක - 0763330100



නම - ඩබ්.කේ.ටී.ප්‍රියන්ත
වසම - ලුණුගල නගරය
දු.ක - 0717086267



නම - ටී.එම්.එන්.පී.තෙන්නකෝන්
වසම - කොට්ටල්බැද්ද
දු.ක - 0717599749



නම - වී.එම්.සී.විස්සුන්දර
වසම - යපම්ම
දු.ක - 0713726576



නම - ඩබ්.පී.ඒ.මිහිරාණි
වසම - මඩුවත්ත
දු.ක - 0701703502

## ආර්ථික සංවර්ධන නිලධාරීන්



නම -එස්.එම්.ආශා ප්‍රියදර්ශනි

වසම - වේරගොඩ

දු.ක - 0764900741



නම - ඩී.එම්.ඩී.කේ.දිසානායක

වසම - පීස්සගම

දු.ක - 0717177834



නම - එච්.එම්. සුජාතා මල්කාන්ති

වසම - බටාවත්ත , ගල්වෙලගම (වැ.බ)

දු.ක - 0753390516



නම - ඩබ්.එම්.ගුණවති

වසම - වැවබැද්ද

දු.ක - 071929808 / 0775747542



නම - ඩී.එම්.වයි.කේ.දිසානායක

වසම - අලකොලගල

දු.ක - 0741393642



නම - ටී.පී.අයි.ශිරන්ත

වසම - උඩකිරුව

දු.ක - 0774393001



නම - පී.එච්.කේ.පී.පුංචිහේවා

වසම - ජනතාපුර දකුණ

දු.ක - 0717185669



නම - ඩී.එම්.අයි.මල්කාන්ති

වසම - සුමුදුගම

දු.ක - 0704979207



නම - ආර්.එම්.පත්මලතා

වසම - අත්තනගොල්ල

දු.ක - 076242849



නම - එම්.පී. පුෂ්පකුමාර

වසම - ගල්උල්ල

දු.ක - 0774502095



නම - ඩබ්.එම්.කුමාරි

වසම - අරවාකුඹුර

දු.ක - 0771918808



නම - ඩබ්.ඒ.ඩී.නිසාන්ති

වසම - ජනතාපුර මධ්‍යම

දු.ක - 0719735490



නම - එස්.එච්.එන්තකුමාරි

වසම - මැටිගහතැන්න , ඇකිරිය (වැ.බ)

දු.ක - 0771172999



නම - කේ.එන්.මාලති

වසම - මහදෝව

දු.ක - 0718430435

ග්‍රාමීය පරිපාලනය



## සමෘද්ධි සංවර්ධන නිලධාරීන්



නම - ඊ.එම්.සෝමදාස මහතා

වසම - සුමුදුගම

දු.ක - 0713186117



නම - ආර්.එම්.උපාලි ප්‍රේමතුංග

වසම - පල්ලේකිරුව

දු.ක - 0775399119



නම - ආර්.එම්.සමන්ලතා මිය

වසම - සූරියගොඩ ,අත්තනගොල්ල (වැ.බ)

දු.ක - 0716982052



නම - ආර්.ඒ.දමයන්ති ප්‍රියංකා

වසම - උඩකිරුව,ලුණුගල නගරය (වැ.බ)

දු.ක - 0702986011



නම - ඒ.කනගරාජ් මහතා

වසම - යපම්ම ,පීස්සගම (වැ.බ)

දු.ක - 0765810418



නම - ඩී.එම්.වසන්තා

වසම - උඩපංගුව,ජනතාපුර දකුණ (වැ.බ)

දු.ක - 0716141790



නම - ඩී.එම්.පත්මලතා මල්කාන්ති මිය

වසම - හොප්ටන් ,මිල්ලබැද්ද (වැ.බ)



නම - ආර්.එම්.අනුලාවති

වසම - අලකොළගල,අරවාකුඹුර (වැ.බ)

දු.ක - 0719953905



නම - ඩී.එම්.දිල්මිණි දිසානායක මිය

වසම - රේන්දපොල

දු.ක - 0717751959



නම - ආර්.එම්.ලලිත් නිරෝෂන

වසම - ඇකිරිය ,මඩොල්සිම (වැ.බ)

දු.ක - 0767186272



නම - එම්.බී.සුනිල් ශාන්ත

වසම - මඩුවත්ත

දු.ක - 0701465100



නම - ඩබ්.ඒ.පී.ධම්මිකා වික්‍රමතුංග

වසම - ජනතාපුර මධ්‍යම,ජනතාපුර උතුර (වැ.බ)

දු.ක - 0702579320

## සමෘද්ධි සංවර්ධන නිලධාරින්



නම - ඩී.එම්.සුදුමැණිකා

වසම - ගල්වෙලගම ,මැටිගහතැන්න (වැ.බ)

දු.ක - 0774526604



නම - ඩබ්.එම්.සිරිල් රාජපක්ෂ

වසම - බටවත්ත ,වැවබැද්ද (වැ.බ)

දු.ක - 0775845752



නම - රේණුකා වාලව්

වසම - කොට්ටල්බැද්ද

දු.ක - 0770501726



නම - ඩබ්.එම්.වසන්ත උදයකුමාර

වසම - මහදෝව

දු.ක - 0767931184



නම - ඒ.රාජනායගම්

වසම - ගල්උල්ල

දු.ක - 0770647878



නම - ආර්.ඩබ්.සුනිල් රාජපක්ෂ

වසම - වේරගොඩ

දු.ක - 0771761971


DIVISIONAL SECRETARIAT, LUNUGALA - MEDIA UNIT

**සහයෝගය දැක්වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයීය සියලුම නිලධාරින්ට බොහෝම ස්තූතියි.....**

**ලුණුගල**

**ප්‍රාදේශිය ලේකම් කාර්යාලයීය මාධ්‍ය අංශය**